# 7 නික්මයාම

ආබ්‍රහම්

↓

ඊසාක්

↓

ජාකොබ්

↓

රූබන්, ලෙවී, ජූද, සිමියොන්, ජෝසෙප්, ඉස්සාකර්, සාබුලොන්, බෙන්ජමින්, නප්තලී, දාන්, ගාද්, ආෂෙර්

දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා කැඳවූ අවස්ථාවේ "මම නුඹ මගින් විශාල ජාතියක් ඇති කරන්නෙමි" (උත්පත්ති 12:2) යනුවෙන් පොරොන්දු වූ සේක. එම පොරොන්දුව ඉටු කරමින් එතුමාගේ පවුල විශාල ජාතියක් ලෙස වර්ධනය කළ සේක. එසේ වර්ධනය වූ විශාල ජාතිය මිසරයෙහි සිටියෝ ය. එලෙසම උන්වහන්සේ ඔහුට හා ජනතාවට දේශයක් ද පොරොන්දු වූ සේක. "මේ දේශය නුඹේ පෙළපතට දෙන්නෙමි" (උත්පත්ති 12:7).

> ජෝසෙප් එවකට මිසරයෙහි සිටියේ ය. කලකට පසු ජෝසෙප් ද ඔහුගේ සහෝදරයෝ සියලු දෙන ද ඒ මුළු පරපුර ද මළහ. එහෙත් ඉශ්‍රායෙල් ජනයා සමෘද්ධ වී, බොහෝ සේ වර්ධනය වී, ගණනින් ද වැඩි වී අතිශයින් බලවත් වූයෙන්, ඔවුන්ගෙන් රට පිරී ගියේ ය.
>
> (නික්මයාම 1:5-6)

මෙලෙස ආබ්‍රහම් තුමාගේ පෙළපත මිසරයෙහි දී වර්ධනය වුයේ මිසර රජවරුන්ගේ අනුග්‍රහය මත ය. එහෙත් පසු කලක දී මෙසේ සිදුවිය.

> එකල ජෝසෙප් ගැන කිසිවක් නොදත් අලුත් රජෙක් සිංහාසනාරූඪ විය.
>
> (නික්මයාම 1:8)

"ජෝසෙප් ගැන කිසිවක් නොදත් රජතුමා" යන්නෙහි අර්ථය වන්නේ, ජෝසෙප් මිසරයට කළ මහඟු සේවාව පිළිබඳ ව නව රජතුමා කිසිවක් නොදත් බව ය. එබැවින් ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට මිසරයේ රජතුමා පියවර තුනක් අනුගමනය කළේ ය:

1. බරවැඩ ගැනීම

   පීතොම් සහ රමසෙස් යන ගබඩා නගර ගොඩනැගීම, කුඹල් කර්මාන්තය, ගඩොල් කර්මාන්තය, කෙත්වල විවිධ කෘෂි කර්මාන්තවල යෙදවීම (නික්මයාම 1:11,14)

2. උපදින විට ම පිරිමි දරුවන් මරා දැමීම

   හෙබ්‍රෙව් වින්නඹුවන්ට රජතුමා අණකරන ලද්දේ හෙබ්‍රෙව් ස්ත්‍රීන් දරුවන් බිහිකරන විට උපදින දරුවා පුතෙක් නම් මරා දමන ලෙසට ය (නික්මයාම 1:16).

3. පිරිමි දරුවන් නයිල් ගඟට විසි කිරීමට අණ දීම (නික්මයාම 1:22).

මෙවැනි පසුබිමක් තුළ මෝසෙස් තුමා උපත ලැබුවේ ය.

දරුවා රුවැති බව දුටු ඈ (මෝසෙස් තුමාගේ මව), තෙමසක් ඔහු සඟවා තැබුවා ය. ඔහු තවත් සඟවා තබා ගැනීමට නොහැකි වූ කල, ඈ පන් පෙට්ටියක් ගෙන, එය පිට කීල් හා මැලියම් තවරා, දරුවා එහි බහා, ගං ඉවුරේ බට ගස් අතර එය තැබුවා ය. එවිට ගඟේ ස්නානය කරනු පිණිස පාරාවෝගේ දූ කුමරිය පැමිණියා ය. ඈ බට ගස් අතර වූ පෙට්ටිය දැක, සේවිකාවක යවා එය ගෙන්වාගෙන, ඇරිය විට එහි දරුවකු දුටුවා ය. ඔහු ඇයට පුතෙකු සේ විය.

(නික්මයාම 2:1-10)

මෙලෙසින් රජ මැඳුරට යාමට මෝසෙස් තුමාට මග පාද දුන් දෙවියන් වහන්සේ රජ දරුවකු ලබන සියලු පහසුකම් යටතේ ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමට ද නායකයකු ලෙස කටයුතු කිරීමට ඇවැසි පුහුණුව ද ලබා දුන් සේක. මෙලෙස ඔහු සූදානම් කළ දෙවියන් වහන්සේ නොදැවෙන කටු පඳුර තුළින් දර්ශනය වෙමින් මෝසෙස් තුමාට තමන් වහන්සේ කවුරුන් ද යන්න හඳුන්වා දුන් සේක.

නුඹේ පියාගේ දෙවියන් වහන්සේ මම ය. ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ද ඊසාක්ගේ දෙවියන් වහන්සේ ද ජාකොබ්ගේ දෙවියන් වහන්සේ ද මම ය.

(නික්මයාම 3:6)


නොමිලේ බෙදාහැරීම සඳහා ය.



7.2 රූපය - දෙවියන් වහන්සේ මෝසෙස් තුමා කැඳවීම

දෙවියන් වහන්සේ මෝසෙස් තුමාට දුන් කැඳවීම වන්නේ ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මුදවා ගෙන පොරොන්දු දේශය කරා රැගෙන යාම යි.


මිසර ජාතීන්ගේ අතින් ඔවුන් මුද, ඒ රටින් ඔවුන් පිට කරවා, සාරවත් විශාල දේශයකට, කිරෙන් හා මී පැණියෙන් ඉතිරෙන දේශයකට, ඔවුන් පමුණුවා ලීම සඳහා මම බැස ආවෙමි.
(නික්මයාම 3:8)

දෙවියන් වහන්සේගෙන් මෝසෙස් තුමා ලද කැඳවීම බාධක හා අභියෝග මැද බාර ගත් එතුමා පාරාවෝ වෙත ගොස් ජනතාව නිදහස් කර ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට පාරාවෝ රජතුමාගේ ප්‍රතිචාරය වූයේ, දේව පණිවිඩය නොපිළිගෙන දෙවිඳුන් රවටමින් තම බලය පෙන්වීම යි. එහෙත් දෙවියන් වහන්සේ මෝසෙස් තුමාට කැඳවීම දුන් අවස්ථාවේ ඔහු දිරිමත් කළ සේක:

මම නුඹ සමග සිටිමි.
(නික්මයාම 3:12)

පාරාවෝ දෙවියන් වහන්සේ රවටමින්, උන්වහන්සේගේ බලපරාක්‍රමය පිළිනොගෙන තම සිත දැඩි කරගනිමින් ක්‍රියා කිරීමේ විපාක නම් ඔහුට සහ මිසර වැසියන්ට වසංගත 10කට මුහුණදීමට සිදු වීම.


**වසංගත දහය**




පීඩා ක්‍රමක්‍රමයෙන් වර්ධනය වෙමින් කුලුඳුලන් මරණයට පත්වීම දක්වා ම පීඩාවන් රාශියකට මුහුණදීමට හේතුව පහත දැක්වෙන ශුද්ධ ලියවිලි පාඨයෙන් පැහැදිලි වේ:

> සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා, "මිසර දේශයේ මාගේ හාස්කම් වැඩිවනු පිණිස පාරාවෝ නුඹට සවන් නොදෙනු ඇතැ"යි වදළ සේක.
>
> (නික්මයාම 11:9)

කුලුඳුලන්ගේ මරණයෙන් පසු ව පාරාවෝ රජතුමා ඉශ්‍රායෙල් සෙනගට යන්නට අවසර ලබා දුන් නමුත් නැවත තම සිත වෙනස් කරගෙන ඉශ්‍රායෙල් ජනතාව ලුහුබැඳ පැමිණීම නිසා දෙවියන් වහන්සේගේ බලපරාක්‍රමය අතිමහත් බව ඉශ්‍රායෙල් ජනතාවට ප්‍රබල ලෙස අත්දැකීමට හැකි විය. ඔවුන් ලද අත්දැකීම් මෙලෙස දැක්විය හැකි ය. ස්වභාව ධර්මයේ ස්වාමියාණෝ උන්වහන්සේ ය. මුළු විශ්වය ම උන්වහන්සේගේ මැවිලි වේ. මිනිසාට දෙවි සමිඳුන්ගේ ආදරය හා රැකවරණය විදහා පෑමට උන්වහන්සේ ස්වභාව ධර්මය උපයෝගී කර ගන්නා සේක.




එද දේව ජනතාව වහල් බවින් මුද පොරොන්දු දේශය කරා ගෙන යාමට මෝසෙස් තුමා තෝරාගත් දෙවියන් වහන්සේ ම බෞතිස්ම ස්නාපනය මගින් දේව දරුවන් වූ අප ව ද විවිධ වහල් තත්ත්වයන්ගෙන් මුද ගෙන දේව රාජ්‍යය නමැති පොරොන්දු දේශයට ගෙන යාමේ වගකීම ශුද්ධ වූ සභා මාතාවට පැවරූ සේක.

බෞතිස්ම ස්නාපනය ලැබූ අපගේ ද වගකීම වන්නේ අප එකිනෙකා බැඳී සිටින්නා වූ වහල්බැම්වලින් මිදී, අප සොයුරු සොයුරියන් ව ද එම තත්ත්වයන්ගෙන් මුදවා ගෙන ස්වර්ග රාජ්‍යය නමැති පොරොන්දු දේශය කරා රැගෙන යාම යි. එම ගමන සාර්ථක වීමට නම් සමාජය තුළ අපට හමුවන්නන් ද විවිධ වහල් භාවයන්ගෙන් මුදවා ගැනීමට කටයුතු කළ යුතු ය. එය දේව දරුවන් වන අපගේ වගකීම වේ.

අපගේ ජීවිත ගමනේ දී ද ඉශ්‍රායෙල් ජනතාවට රැකවරණය දුන් දෙවියන් වහන්සේ අපට ද දිව්‍ය සංරක්ෂණය තුළ සුරකින බවට හා අපගේ සියලු අවශ්‍යතා සපුරන බවට දැඩි විශ්වාසයක් පැවතිය යුතු ම ය. එම විශ්වාසය ක්‍රියාකාරී විශ්වාසයක් විය යුතු ය. ක්‍රියාකාරී නොවන විශ්වාසය පිළිබඳ ව ජාකොබ් ලිපිය මෙසේ ලියා ඇත.

> මාගේ සහෝදරයෙනි, තමාට ඇදහිල්ල ඇතැයි යමෙකු කීවත් ක්‍රියාවලින් එය ප්‍රකාශ නොවේ නම්, ඉන් වැඩක් ඇද්ද? එවැනි ඇදහිල්ලක් ඔහුට ගැලවීම ගෙන දෙයි ද? ක්‍රියා විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලකි.
>
> (ජාකොබ් 2:14,17)

**ක්‍රියාකාරකම**

1. අද සමාජයේ ජීවත් වන තරුණ පිරිස් වහල් වී සිටින වහල්භාවයන් **පහක්** නම් කර, ඒවායින් මිදීමට ගත යුතු ක්‍රියාමාර්ග ලියා දක්වන්න.
2. මෝසෙස් තුමා ලැබූ කැඳවීම තුළ, ඔහුට මුහුණදීමට සිදුවූ අභියෝග **පහක්** ලියා දක්වන්න.
4. ඔබගේ ඇදහිල්ල ක්‍රියාකාරී ඇදහිල්ලක් වීමට නම් ඔබ ජීවත් විය යුතු ආකාර උදහරණ **තුනක්** මගින් පැහැදිලි කරන්න.



**ජීවිතයට බිඳක්**

*සග මග පටු ය කටු සහිත ය අවහිර ය*
*සග සෙත ලබන්නට ඔබ වෙහෙසිය යුතු ය*
*මග දුගතිය වෙත යන සුවිසල් වනු ය*
*මග එම ගෙන එහි යන අය ද සිටිනු ය*

*(කිතුනු සුභාෂිතය 70වන ගීතය ආචාර්ය දොන් පීටර් පියතුමා)*